④ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1894/27 - 2014 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2014.12.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය :- 01/10/03/04

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරන ලද පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර සී. නන්ද මැතිව් වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත සඳහන් පත්කිරීම් සිදුකර කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ :–

01. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන පන්තියේ නිලධාරි කේ. ඒ. බී. සෙනවිරත්න මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2014.09.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරි කේ. එම්. දිසානායක මහතා 2014.11.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි, ඌව පළාත් සභාවේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික, සමාජ සුබසාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන) වශයෙන්.

03. ඌව පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, ප්‍රවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ගුණදාස සමරසිංහ මහතා අසනීප වී සිටින බැවින්, 2014.11.10 දින සිට ඒ මහතා නැවත රාජකාරි සඳහා වාර්තා කරන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරි ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, ප්‍රවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට.

04. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරි ඩබ්. එම්. නිමල් වීරසිංහ මහතා 2014.11.03 වන දින සිට වියළුව කලාප අධ්‍යාපන කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2015.11.02 වන දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05. ඌව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ආර්. එම්. එස්. ඩී. රත්නායක මහත්මිය 2014.10.18 දින සිට 2014.11.01 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.10.18 දින සිට ඒ මහත්මිය නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) තනතුරේ වැඩ බැලීමට.

06. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ නිවාස කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට.

07. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නොවන ඉංජිනේරු සේවයේ විශ්‍රාමික නිලධාරි එස්. ටී. තෙන්නකෝන් මහතා 2014.11.04 වන දින සිට ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2015.11.03 වන දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුරේ කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට.

08. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරි ඩබ්ලිව්. රන්දෙණිය මහතා 2014.11.10 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බදුල්ල මහ නගර සභාවේ නාගරික කොමසාරිස් වශයෙන්.

09. ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය පරිවාස හා ළමාරක්ෂක සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් එල්. එල්. අනිල් විජේසිරි මහතා 2014.11.21 දින සිට 2014.11.26 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.11.21 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධාරි ඩබ්. එම්. එම්. ජී. අබේසිංහ බණ්ඩා මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය පරිවාස හා ළමාරක්ෂක සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට.

10. ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ (ඌව) වෛද්‍ය ආර්. එම්. ආරියදාස මහතා 2014.11.29 දින සිට 2014.12.06 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.11.29 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරි පශු වෛද්‍ය එන්. ජී. සී. වයි. ද සිල්වා මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ (ඌව) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

11. ඌව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (ඌව) ආර්. එම්. නන්දසිරි මහතා 2014.11.29 දින සිට 2014.12.06 දින දක්වා විදේශ ගත වන බැවින්, 2014.11.29 දින සිට ඒ මහතා නැවත දිවයිනට පැමිණෙන තෙක් ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරි එච්. කේ. පී. ජයලත් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (ඌව) තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

සී. නන්ද මැතිව්,
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2014 දෙසැම්බර් මස 22 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

01 - 350

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.